**මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**
**අනුරාධපුර දිස්ත්‍රික්කය**
**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**----------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ** විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයා වෙත යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
-----------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ,මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂය තුළ තැන්පත්කල එහෙත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ගෙවා නොතිබූ එකතුව රු.741,670 ක් වූ තැන්පතු 06 ක් මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට තැන්පත් ශේෂය තැන්පත් ලේඛනයට අනුව රු.3,117,123 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,749,330 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම බැරකම් රු.632,207 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) කඩකාමර කුලී ලේඛනය අනුව 2017 දෙසැම්බර් 31 දිනට හිග කඩකුලී ආදායම රු.359,490 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.376,060 ක් ලෙස දක්වා තිබීම නිසා ජංගම වත්කම් රු.16,570 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ටෙන්ඩර් කුලී ආදායම් ලේඛනයට අනුව 2017 දෙසැම්බර් 31 දිනට හිග කුලී ආදායම රු.849,932 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,434,339 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.584,407 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට වූ ශේෂ 06 ක් සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස සටහන් කිරීමේදී රු.20,902,073 ක වෙනස්කම් විය.

(ඊ) සභාව සතු මහවිලච්චිය හා ඇලයාපත්තුව සතිපොළවල් වලින් එකතුව රු.550,130 ක ආදායම් රැස්කරගෙන තිබුණු නමුත් වර්ෂයේ බිල්කල ආදායම වෙනුවට ඇස්තමේන්තුගත ආදායම වූ රු.903,700 ක මුදල ආදායම් ගිණුමට බැරකර රු.391,095 ක් හිගහිටි ආදායම් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ අතිරික්තය හා ජංගම වත්කම් එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(උ) වර්ෂය තුළ පුස්තකාල පොත් මිලදී ගැනීම වෙනුවෙන් ලැබී තිබුණු රු.128,390 ක මුදල පුනරාවර්තන ආදායම් හා වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ප්‍රාග්ධන ආදායම් හා වියදම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඟ) ප්‍රා.ස. 4ට අනුව 3.81 ආදායම් ශීර්ෂය යටතේ ප්‍රාග්ධන ලැබීම් රු.33,131,142 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.40,570,241 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් රු.7,439,099 කින් ප්‍රාග්ධන ආදායම් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සභාව සතු මස්කඩ 02 ක්, කඩකාමර 08 ක් හා ආර්ථික මධ්‍යස්ථානය බදු දීම වෙනුවෙන් වර්ෂය තුළ අයවිය යුතු ආදායම රු.5,168,832 ක් වුවත් ආදායම් වියදම් ගිණුමේ එය රු.4,197,200 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම් රු.971,632 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) 2017 දෙසැම්බර් 31 දිනට හිග ටෙන්ඩර් දේපල බදු ආදායම රු.849,932 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,434,339 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.584,407 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) 2017 දෙසැම්බර් 31 දිනට හිග කඩකාමර කුලී රු.358,490 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.376,060 ක් ලෙස දක්වා තිබීම නිසා ජංගම වත්කම් රු.17,570 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඕ) උතුරු මැද පළාත් සභාවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.3,398,807 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,000,000 ක ලෙස සටහන් කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම් හා ජංගම වත්කම් රු.398,807 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) දේශීය ණය සංවර්ධන අරමුදලින් ලබාගත් ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණු රු.309,204 ක පොලිය දේශීය ණය සංවර්ධන අරමුදල් ගිණුම හර කිරීම හේතුවෙන් වියදම් හා දේශීය ණය සංවර්ධන අරමුදල් ණය ශේෂය එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.3,195,268 ක් වුවත් එය රු.2,920,215 ක් ලෙස දක්වා තිබීම නිසා එම ණය ශේෂය රු.275,053 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) 2016 වර්ෂයේ බැරකම් ලෙස හඳුනාගෙන නොතිබූ නමුත් 2016 වර්ෂයට අදාල 2017 වියදම් ලෙස ගෙවා තිබුණු රු.634,730 මුදලින් සමාලෝචිත වර්ෂයේ වියදම් වැඩියෙන් දක්වා තිබුණි.

(ජ) 2017 දෙසැම්බර් 31 දිනට සේවක ණය රු.1,427,314 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,596,491 ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් රු.169,177 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ට) 2016 වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරියට ගෙන ආ සමුච්චිත අරමුදලේ ශේෂයට 2017 වර්ෂයට අදාල ගැලපුම් කල පසු ශේෂය රු.24,215,305 ක් විය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.9,650,515 ක් ලෙස දක්වා තිබීම නිසා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.14,564,790 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුනු ගිණුම්
---------------------

ප්‍රා.ස. 14 හා ආදායම් වියදම් ගිණුමේ දැක්වෙන වියදම් ශේෂය අතර රු.225,739 ක වෙනසක් පැවතුණි.

1.3.3 අවිනිශ්චිත ගිණුම්
--------------------

2016 දෙසැම්බර් 31 දිනට රු.268,126 ක් වූ අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සඳහා සමාලෝචිත වර්ෂයේ කිසිදු ගැලපීමකින් තොරව රු.243,792 ක් කපාහැර 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.24,334 ක් ලෙස දක්වා තිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු.77,538 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක් සමාලෝචිත වර්ෂය තුළදී ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

වර්ෂ ගණනාවක සිට පැවත එන එකතුව රු.2,401,391 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 07 ක් සමාලෝචිත වර්ෂය තුළ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.108,834,876 ක් වූ ගිණුම් විෂයන් 4 ක් විගණනයේදී සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

-------------------

1.3.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

---------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත | රු. | |
| (i) 134(3) | | සභා සීමාව ඇතුළත පිහිටියාවූද ස්ථිර හෝ නිතිපතා ගොවිතැනක් යටතේ වූද එක් එක් ඉඩම් හෙක්ටයාරය මත පදනම්ව අක්කර බද්දක් පනවා අමාත්‍යාවරයාගේ අනුමැතියට යටත්ව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 177 වගන්තිය | | සභාවේ සේවය කරන තාවකාලික හා අනියම් සේවකයන් වෙනුවෙන් පාරිතෝෂික ගෙවීම සඳහා වූ යෝජනා ක්‍රමයක් පිහිටුවීම පිණිස අතුරු ව්‍යවස්ථාවක් පැනවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | | |
| (i) රීති 5.11 | | සභාව සතු මාර්ගස්ථ මුදල් සහ වෙනත් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබුණි. |
| (ii) රීති 217 හා 218 | | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් P.S.46 ආකෘතිය ප්‍රකාරව ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 16 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1998 දරන ගැසට් පත්‍රය | 505,045 | ගැසට් පත්‍රයේ සඳහන් ප්‍රමාණයට වඩා ගාස්තු හා බදු අයකළ අවස්ථා 34 ක් නිරීක්ෂණය විය. |

2 මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය
-------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.9,166,099 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.7,788,787 ක් විය.

2.2 ආදායම් පරිපාලනය 

---------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------

(අ) සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ බිල්කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ .

| ආදායම් ප්‍රභවය | 2017 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය | 2017 වර්ෂයේ බිල්කළ ආදායම | 2017 වර්ෂයේ රැස් කළ ආදායම | | 2017 දෙසැම්බර් දිනට 31 හිඟහිටි ආදායම |
|---|---|---|---|---|---|
| | වටිනාකම | වටිනාකම | 2017 ජනවාරි 01 දිනට ශේෂයෙන් ලැබීම් වටිනාකම | 2017 වර්ෂයට බිල්කළ ආදායම වටිනාකම | වටිනාකම |
| | රු. | රු. | රු. | රු. | රු. |
| කසල සේවා | 955,850 | 450,000 | 2,600 | 291,550 | 1,111,700 |
| නළලිං | 1,069,300 | 65,000 | 3,800 | 11,200 | 1,121,300 |
| උසාවි දඩ | 1,541,531 | 3,000,000 | - | - | 4,541,531 |
| මුද්දර ගාස්තු | 6,944,557 | 3,000,000 | - | - | 9,944,557 |
| කඩකුලී | 300,568 | 544,882 | 5,160 | 253,430 | 586,860 |
| සතිපොල | 133,330 | 326,075 | - | 326,075 | 133,330 |
| මස්කඩ | 393,855 | 4,197,200 | 82,050 | 3,756,300 | 752,705 |
| එකතුව | 11,338,991 | 11,583,157 | 93,610 | 4,638,555 | 18,191,983 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ රු.11,338,991 ක් වූ මුළු හිග ආදායමෙන් සියයට 0.8 ක් වූ රු.93,610 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ රු.11,583,157 ක ආදායමෙන් සියයට 40 ක් හෙවත් රු.4,638,555 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ රැස්කරගෙන තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.11,583,157 ක් වූ වර්ෂයේ බිල්කල ආදායමෙන් සියයට 157ක් පමණ වූ රු.18,193,983 ක් හිග ආදායම් ලෙස පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

3.1 කාර්යසාධනය

---------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා පොදු මංමාවත් පිළිබඳ කාරණා , විධිමත් කිරීම හා පාලනය කිරීම , ජනතාවගේ සුබ විහරණය ,පහසුව හා සුහසාධන යන සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 28 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 වනවිටත් එකී කාරණා ඉටු කිරීමට අදාලව අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

---------------------

සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා බල ප්‍රදේශයේ රැස්වන කැලිකසළ කළමනාකරණයක් සිදුකර නොතිබූ අතර රු.3,640,264 ක් වැයකර ලෝලුගස්වැව ප්‍රදේශයේ 2016 වර්ෂයේ දී ඉදිකර තිබුණු පිළිසරු ව්‍යාපෘතිය 2018 මැයි 20 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ඇ) පාරිසරික ගැටළු

------------------

සභා බල ප්‍රදේශයේ රැස්වන කැලිකසළ ලෝලුගස්වැව වන රක්ෂිතයට අවිධිමත් ලෙස මුදාහැරීම හේතුවෙන් පරිසරයට විශාල හානියක් සිදුවීම හා අලින් වැනි වන සතුන් කැලිකසළ ආහාරයට ගැනීමෙන් වන සතුන්ගේ ජීවිතවලට අවදානම් තත්ත්වයක් පැවතුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය පිළිබඳ සභාව දැනුවත් වී නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු ට්‍රේලර් 02 ක්, රෝද 4 ට්‍රැක්ටර් 02 ක්, හා අත්ට්‍රැක්ටරයක් 2018 ජුනි 13 දින වන විටත් ලියාපදිංචිකර නොතිබුණි.

(ආ) සභාව සතු ධාවන තත්වයේ පවතින රථ වාහන 17 කට වලංගු ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ඇ) රක්ෂණාවරණයක් ලබානොගෙන ටැෆේ ට්‍රැක්ටරය සහ ට්‍රැක්ටර් ට්‍රේලරය ධාවනයේ යොදවමින් පැවතුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------------

සභාව සතු කඩ කාමර සඳහා වර්ෂ ගණනාවක සිට දේපල තක්සේරුවක් සිදුනොකර පවතින ගාස්තු අයකරමින් පැවතුණි.

3.4 වත්කම් කළමනාකරණය

----------------------------

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

---------------------------------------------

සභා බල ප්‍රදේශයේ පිහිටි භූමි ප්‍රමාණය අක්කර 258 ක් වූ සුසාන භූමි 89 ක මායිම් ලකුණු කර වැටවල් යොදා ආරක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

3.4.2 පවරානොගත් වත්කම්

-------------------------

සභා ගොඩනැගිල්ල ඇතුළු සභාවේ ඉදිකිරීම් සිදුකර තිබෙන භූමි ප්‍රමාණය අක්කර 5 රූඩ් 01 පර්චස් 23 ක් විශාල ඉඩම් ඒකක 11 ක් හා ප්‍රමාණය සඳහන් නොවූ භූමි 18 ක අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්

-----------------------------------------

වටිනාකම සඳහන් නොවූ වත්කම් විෂයයන් 39 ක් දීර්ඝ කාලයක සිට භාවිතයට ගැනීමකින් තොරව සභා භූමියේ ගොඩගසා තිබුණි. මෙම වත්කම් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 ප්‍රසම්පාදනය

---------------

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව ප්‍රසම්පාදන සැලැස්මක් සකස්කර නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය
----------------------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 168(1) ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මාර්තු 31 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 ජුනි 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 අයවැය පාලනය
------------------

නිසි පුරෝකථනයකින් තොරව අයවැය ඇස්තමේන්තු සකස්කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් විෂයයක අයවැයගත ආදායම හා තත්‍ය ආදායම අතර සියයට 162 ක විචලනයන් හා වියදම් විෂයයන් 7 ක අයවැයගත වියදම් හා තත්‍ය වියදම් අතර සියයට 21 සිට සියයට 82 දක්වා වූ පරාසයකින් යුක්ත විචලනයන් නිරීක්ෂණය විය.

4.3 අභ්‍යන්තර විගණනය
------------------------

උතුරු මැද පළාත් පාලන කොමසාරිස්ගේ 2015 මාර්තු 18 දිනැති අංක 04/2015 දරන චක්‍රලේඛයේ 06 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙකු පත්කර නොතිබුණි.

4.4 විගණන හා කළමනාකරණ කමිටු
--------------------------------------

2009 ජුනි 09 දිනැති අංක DMA 2009 (1) දරන කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුව විසින් නිකුත්කර ඇති චක්‍රලේඛයට අනුව 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිතකර නොතිබුණි.

5 පද්ධති හා පාලන
-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ලෙජර් ගිණුම් යාවත්කාලීනව පවත්වාගෙන නොයාම. |
| | | (ii) | ප්‍රා.ස. වාර්තා නිසි පරිදි නඩත්තු නොකිරීම. |
| | | (iii) | පෙර වර්ෂයේ ශේෂයන් නිවරදි කිරීමේදී ජ'නල් සටහන් නොයෙදීම. |
| (ආ) | අභ්‍යන්තර පාලනය | (i) | අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක නොකිරීම. |
| | | (ii) | විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිතකර නොතිබීම. |
| (ඇ) | සැලසුම් කිරීම | | ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම, සේවා මණ්ඩල සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර නොතිබීම. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | දේපල බදු දීම් | (i) | ගිවිසුම් යාවත්කාලීන නොකිරීම. |
| | | (ii) | ගිවිසුම් ප්‍රකාර බදු හා ගාස්තු අයනොකිරීම. |
| | | (iii) | බදු නොගෙවන ආයතන සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| (ඊ) | ස්ථාවර වත්කම් | (i) | සියළු වත්කම් ලේඛනගත නොකිරීම. |
| | | (ii) | අයිතිය පවරා නොගැනීම. |